වැලිගම නගර සභාව

<u>මාතර දිස්ත්‍රික්කය.</u>

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට වැලිගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී සේවකයින්ගේ වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකල රු.1,394,978ක් වැටුප් හා වේතනවලින් අඩුකර නොතිබුණි. | වැටුප් හා වේතන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | වැටුප් හා වේතන වියදම් වටිනාකම අඩුවෙන් නිරූපනය වීම වලක්වා ගැනීම සඳහා වැටුප් රහිත නිවාඩු වටිනාකම වර්ෂයේ අයකළ හැකි ආදායම් ශීර්ෂයට බැර කරන ලදී. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබූ රු.488,192 ක ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වාර්තාවල නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.237,126 ක් වූ තොග ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | තොග නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී එම තොරතුරු එකතු කිරීමට |

කටයුතු කරන බව දන්වමි.

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.20,027,702 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන සහ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 1,037,667 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 සහ 757 | එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බඩු ලේඛන පොත තුලනය කර බඩු ලේඛන පොතෙහි දැක්වෙන ශේෂය සමඟ භෞතිකව ඇති ශේෂය නිවැරදිදැයි පරීක්ෂා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | වරද ඉදිරියේදී නොවීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 22.4 ඡේදය | සභාවේ සේවකයින්ගේ වැටුප් රහිත නිවාඩු වාර්තා මාස්පතා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.50,148,678 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.26,440,297 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,050,000 | 12,501,257 | 11,615,984 | 7,974,517 | 10,050,000 | 10,588,176 | 9,284,411 | 7,089,244 |
| කුලී | 15,203,000 | 15,149,632 | 11,537,415 | 9,038,801 | 15,897,200 | 12,809,606 | 11,178,912 | 5,426,584 |
| බලපත්‍ර ගාස්තු | 3,926,500 | 7,133,800 | 7,133,801 | 336,458 | 3,326,500 | 4,453,836 | 4,453,836 | 336,459 |
| වෙනත් ආදායම් | 49,364,000 | 47,057,390 | 27,055,034 | 47,421,361 | 45,456,000 | 30,435,604 | 25,102,453 | 27,419,005 |
| එකතුව | 81,543,500 | 81,842,079 | 57,342,234 | 64,771,137 | 74,729,700 | 58,287,222 | 50,019,612 | 40,271,292 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.81,543,500 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.40,271,292 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.81,842,079 ක් සමඟ රු.122,113,371 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.57,342,234 ක් පමණක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.64,771,137 ක් විය. අයවීමේ ප්‍රගතිය සියයට 47 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ආදායම් වර්ධනය කිරීමට ඉදිරියේදී කටයුතු කරන අතර හිඟ ශේෂ අයකර ගැනීමට නීතිමය කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.6,743,278 ක් වූ අතර, රු.8,744,916 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සහ අධි ගාස්තු සමග රු.15,488,194 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.7,832,400 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.7,655,788 ක හිඟ ශේෂයක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම් බිල් කිරීම් හා වර්ෂය ආරම්භයේ හිඟ ශේෂයෙන් සියයට 50 ක් විය.<br>නගර සභා ආඥා පනතේ 170(1) හා (2) වගන්ති ප්‍රකාර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේදී ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) විනෝද බදු** | | |
| ආරම්භක හිඟ විනෝද බදු ශේෂය රු.345,965 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.185,918 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.213,135 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.318,748 ක් හිඟව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම්, බිල් කිරීම් හා වර්ෂය ආරම්භයේ හිඟ ශේෂයෙන් සියයට 40 ක් තරම් අවම මට්ටමක පැවතුණි. | හිඟ විනෝද බදු ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේදී ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **කඩ කුලී** | | |
| ආරම්භක හිඟය රු.2,596,617 ක් වූ අතර, රු.5,363,767 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමග රු.7,960,384 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.2,593,001 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.5,367,383 ක් හිඟ ශේෂයක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවිම්, බිල්කිරීම් හා වර්ෂය ආරම්භයේ හිඟ ශේෂයෙන් සියයට 32 ක් විය. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතු වේ. | කඩ කුලී ගෙවන ලෙස කඩහිමියන් දැනුවත් කර ඇත. |

### 2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.143,901ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.48,129,149ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගත යුතු වේ. | ලිපි මඟින් ඉල්ලීම් කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 10 ක් සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. | ප්‍රාථමික හා වෙනත් තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර ඇති අතර ජ්‍යෙෂ්ඨ හා ද්විතීයික තනතුරුවල පුරප්පාඩු සඳහා දැනුම් දී ඇත. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 මැයි 16 දින පවත්වන ලද සැලසුම් කමිටු තීරණ අංක 1431 මගින් අනුමත කරන ලද BA/23/2017 අංක දරන අනුමත ගොඩනැගිලි සැලසුමට අනුව වර්ග මීටර් 326 ක ප්‍රමාණයට වාහන ස්ථාන නැවතුම් 4ක් වෙන්කල යුතු වුවත් එසේ නොකිරීම නිසා අංක 1597/8 දරන හා 2009 අප්‍රේල් 17 දිනැති ගැසට් පත්‍රයේ 5 ඡේදය ප්‍රකාරව රු.500,000 බැගින් රු.2,000,000 ක් අයකර ගෙන නොතිබූ අතර ගැසට් පත්‍රයේ 6(11) ඡේදය ප්‍රකාරව ගොඩනැගිලි සැලසුමට අනුකූල නොවන පරිදි ඉදිකර තිබූ වර්ග මීටර් 108 ක් පමණ වන තෙවන මහල වෙනුවෙන් රු.216,000 ක් අය කර ආවරණ අනුමැතිය ලබා දී නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සැලසුම් කමිටු නිර්දේශ මත අයකළ යුතු දඩ මුදල් හා අනෙකුත් අයකර ගැනීම් සඳහා කටයුතු කරමි. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය ප්‍රකාරව ජලය හා විදුලිය පදිංචි තැනැත්තන් විසින් ගෙවිය යුතු වුවද සේවක පදිංචි නිවාසයක් වෙනුවෙන් 2015 අගෝස්තු 01 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.203,293 ක ජල හා විදුලි ගාස්තු සඳහා සභා අරමුදලින් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | නිල නිවාසය සඳහා වෙනම විදුලි හා ජල මනු සවිකිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2013 ඔක්තෝබර් 25 දිනැති අංක 1834 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කලින් කලට තීරණය කරන පරිදි නියමිත ගාස්තු ගෙවීම මත අපද්‍රව්‍ය භාර ගැනීම කළයුතු අතර දකුණු පළාත්, පළාත් පාලන අමාත්‍යාංශයේ 2014 ඔක්තෝබර් 28 දිනැති අංක 1886/12 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද නගර සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 7.14 ප්‍රකාරව අදාළ විධිවිධාන වැළඳගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ හෝටල් 32 ක කසළ බදු සංශෝධනය කිරීම සිදුකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කසළ බදු අය කර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇති බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී නගර සභා බල ප්‍රදේශයේ පිහිටි ලැගුම්හල් 62 ක් බලපත්‍ර ලබාගෙන තිබුණද කසළ බදු අය කර තිබෙන්නේ ලැගුම්හල් 32 කින් පමණි. | සභා බල ප්‍රදේශයේ සියළුම ලැගුම්හල් වලින් කසළ බදු අයකළ යුතු වේ. | කසළ බදු අය නොකරන ස්ථාන සඳහා සේවා ගාස්තු හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී. |
| (ඉ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව වසර 05 කට වරක් කඩ කාමර කුලිය තක්සේරු කළ යුතු වුවත් සභාව සතු කඩ කාමර 158 ක් එසේ තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නව තක්සේරු ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| (ඊ) | නගර සභාව සතු සුපිරි වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර 02 කින් හා බස් නැවතුම්පොළ කඩ කාමර 04 කින් එක්වන් මුදල් රු. 1,570,601 ක් 2007 වසරේ සිට හිඟව පැවතුණි. | හිඟ මුදල් කඩිනමින් අයකළ යුතු වේ. | බදු කරුවන් දැනුවත් කර ඇත. |
| (උ) | නගර සභාව සතු නගර ශාලාව උත්සව සඳහා කුළියට ලබාදීමේදී ශාලා ගාස්තුවට අමතරව ජලය විදුලිය හා පිරිසිදු කිරීම් වෙනුවෙන් එක් අවස්ථාවකට රු. 4500 ක මුදලක් අයකළ යුතු වුවද මංගල උත්සවවලදී මෙම ගාස්තු අයකර නොතිබූ අතර නියැදි පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයේදී මංගල උත්සව 66 ක් සඳහා රු. 297,000 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | ජල, විදුලි හා පිරිසිදු කිරීම් වෙනුවෙන් සේවා ගාස්තු අයකළ යුතු වේ. | මංගල උත්සවය සඳහා ශාලා ගාස්තුවට අයවැය ලේඛනයේ සේවා ගාස්තු ද ඇතුළත් කර ඇති බැවින් සේවා ගාස්තු වෙනම ලබා නොගැනේ. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභා අරමුදලින් සංඝානන්ද පළමු පටුමඟ (පඩිපෙළ පාර) කොටසෙහි ඇති පැතිබැම්ම ඉදිකිරීම වෙනුවෙන් රු.699,430ක් වැයකල නමුත් මෙම පැතිබැම්ම ප්‍රධාන මාර්ගයට සැළකිය යුතු දුරක පිහිටි පෞද්ගලික ඉඩම්හිමියෙකුගේ ඉඩම ආරක්ෂා වන පරිදි කල ඉදිකිරීමක් විය. | සභා අරමුදල් පොදු කටයුතු සඳහා යෙදිය යුතු වේ. | ඉදිරියේදී සභා යෝජනා මත මාර්ගය වාහන ගමනා ගමනයට සුදුසු පරිදි ඉටු කිරීමට කටයුතු කරමි. |
| (ආ) | නගර ශාලාවේ විදුලි වියදම සමාලෝචිත වර්ෂයේදී රු.1,589,384 ක් වූ නමුත් ශාලාව කුලියට ගන්නන්ගෙන් විදුලිය හා පිරිසිදු කිරීමේ වියදම් වෙනුවෙන් අයකර තිබූ ගාස්තුව රු.858,000 ක් විය. | නගර ශාලාවට විදුලි මනුවක් සවි කළ යුතු වේ. | නගර ශාලාව හා සභා කාර්යාලය සඳහා එක් විදුලි මනුවක් සවි කර තිබෙන බැවින් විදුලිය වෙන් වෙන්ව සංඛ්‍යාත්මකව පෙන්වීමට නොහැක. |

**3.4 කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ කප්පරතොට ප්‍රජාශාලාව අළුත්වැඩියා කිරීම සඳහා රු. 5,577,804 ක මුදලක් 2018 සැප්තැම්බර් 27 දින අනුමත කර තිබූ අතර කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම වෙනුවෙන් රු.52,000ක වියදමක් දරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය තුළදී කර්මාන්තය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්යයන් නියමිත පරිදි සැලසුම් කර ගත යුතු වේ. | ප්‍රමාණවත් කාලයක් නොතිබූ බැවින් කර්මාන්ත ඉටු කිරීමට නොහැකි විය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂයන් 07 ක රු.32,913,895 ක ඉතිරිවීම් තිබුණි. එම අගයන් සියයට 3 සිට සියයට 90 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කල යුතු වේ. | අයවැය ගත හා තථ්‍ය වියදම් අතර විචලනයන් අවම මට්ටමකින් පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) අදායම් විෂයන් 05 ක ලඟාකර නොගත් ඉලක්කවල එකතුව 9,936,983 ක් වූ අතර එම අගයන් සියයට 3.4 සිට 20 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කල යුතු වේ. | අයවැය ගත හා තථ්‍ය ආදායම් අතර විචලනයන් අවම මට්ටමකින් පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු කරමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගෙන් විමසා නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අභ්‍යන්තර විගණනය සම්බන්ධ කටයුතු නිසි ක්‍රමවේදයකට අනුව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර මාසික අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |